අනාගමිකත්වය යනු රජය සහ ආගම අතර සෑම ආකාරයක ම සබඳතාවන් ඉවත් කරන්නක් බවටත් 9 වන ව්‍යවස්ථාව නිසා ශ්‍රී ලංකාව ආගමික රාජ්‍යයක් බවට පත්වන බවටත්, එය ඉතා නොදියුණු තත්ත්වයක් බවටත් මතයක් රට පුරා පතුරා තියෙනවා. නමුත් මෙය මෙසේ ම නොවන බව ඇතැම් මූලාශ්‍ර අනුව පෙනී යනවා.

ආචාර්ය ජයම්පති වික්‍රමරත්න මහතා බී.බී.සී. සිංහල සේවයත් සමග කළ සංවාදයක දී මේ ගැන පළකළ අදහසක් ඒ සේවය වාර්තා කර තිබුණේ මෙලෙස යි.

> ශ්‍රී ලංකාව අනාගමික රාජ්‍යයක් බව ශ්‍රේෂ්ඨාධිකරණය අවස්ථා දෙකකදීම තීන්දු කර තිබෙන බව එක්සත් වාමාංශික පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය ජයම්පති වික්‍රමරත්න මහතා පවසයි.
>
> හිටපු අගවිනිසුරු සරත් නන්ද සිල්වා ගේ ප්‍රධානතත්වයෙන් යුත් විනිසුරු මඩුල්ලක් සහ විනිසුරු රාජා ප්‍රනාන්දුගේ සභාපතිත්වයෙන් යුත් විනිසුරු මඩුල්ලක් විසින් ඒ බව තීන්දු කරනු ලැබ ඇති බව ජයම්පති වික්‍රමරත්න මන්ත්‍රීවරයා පෙන්වා දෙයි.
>
> 2017 වසරේ දී ලන්ඩන් නුවර සංචාරයක් අතරවාරයේ ෆේස්බුක් ඔස්සේ 'බීබීසී සිංහල සේවය' සමග සජීව ලෙසින් අදහස් දක්වමින් ඔහු ඒ බව සඳහන් කර ඇත්තේ, යහපාලන ආණ්ඩුව විසින් ගෙන ඒමට නියමිතව තිබූ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් අදහස් දක්වමිනි.
>
> - "ශ්‍රී ලංකාව බෞද්ධ රාජ්‍යයක් නොවේ" - ශ්‍රේෂ්ඨාධිකරණය දෙවරක්ම තීන්දු කරලා
> - ව්‍යවස්ථාව: "ශ්‍රී ලංකාව බෞද්ධ රාජ්‍යයක් නොවේ; අනාගමික රාජ්‍යයක්"

ඒ වගේ ම Sri Lankan Guardian විසින් Sri Lanka Constitutional Debate මැයෙන් පළකර තිබුණු ලිපියකත් මෙලෙස පවසා තිබුණා.

> The Sri Lankan constitution does not cite a state religion. Nonetheless, rather ambiguously, Article 9 states that, "The Republic of Sri Lanka shall give to Buddhism the foremost place, and accordingly, it shall be the duty of the State to protect and foster the Buddha Sasana".Nonetheless, in the famous judgment on Noise pollution, the Supreme Court held that Sri Lanka is a secular state:
>
> “It has to be firmly borne in mind that Sri Lanka is a secular State. In terms of Article 3 of the Constitution, Sovereignty is in the People at common

> devoid of any divisions based on perceptions of race, religion, language and the like. Especially in the area of preserving the environment and the protection of public health, being of immediate concern in this case, there could be no exceptions to accommodate perceived religious propensities of one group or another. No religion advocates a practice that would cause harm to another or worse still as would cause pollution of the environment, a health hazard or a public nuisance being an annoyance to the public.”

එහි මේ කරුණට පාදසටහනක් යොදමින් මූලාශ්‍රය ලෙස දක්වා තිබුණේ ආශික් එ. බන්දුල නඩුවයි. මෙය ඉහත දැක්වූ ජයම්පති මහතාගේ ප්‍රකාශයත් සමග ගත යුතු යයි සිතනවා.

මේ ගැන බොහෝ මූලාශ්‍ර කියවූ විට වැටහෙන දෙයක් තමයි අනාගමික රාජ්‍ය යනු හැමවිටම ආගම සමග සියලු සබඳතා නවත්වන්නක් නොවන බව යි. නිදසුනක් ලෙස ආගම පිළිබඳ අතුරු කමිටුවට අනාගමික යෝජනාව ඉදිරිපත් කළ ආචාර්ය කුමුදු කුසුම් කුමාර පවසන්නේ අනාගමික රාජ්‍යයක් යනු ආගම බැහැර කරන රාජ්‍යයක් නොවන බව යි. (අනාගමික රාජ්‍යයක් යනු ආගම බැහැර කරන රටක් නොවේ)

ආගමික මූලධර්ම මත නොව ලෞකිකත්වය මත පදනම් ව රට පාලනය කරන රාජ්‍යය අනාගමිකයි. යුරෝපයේ අනාගමික සංකල්පය බිහි වූයේ පල්ලිය පාලනයට ඇඟිලි ගැසීමෙන් වැළකීමටයි. ඒ අනුව ආගම අනුව පාලනය කිරීම වැළැක්වුවා. ආගම පදනම් කරගත් නීති සෑදීම වැළැක්වුවා. එය යි අනාගමිකත්වය. නමුත් ආගමක් පදනම් කරගෙන ම පාලනය කිරීමත් ආගම්වලට ආධාර උපකාර කිරීම හෝ කිසියම් සංකේතීය ප්‍රකාශයක් තිබීම එයට පටහැනි නැහැ. රාජ්‍යය ආගමෙන් වෙන්කර තිබිය යුතු යි කියන්නේ පාලනයට බලපෑම් වන අයුරින් විතරයි. මොන ම විධියකින්වත් ආගම් සමග රජය අත්වැල් බැඳ නොගත යුතු යි යන පැරණි මුල් යුරෝපියානු මතය රැඩිකල් අනාගමිකත්වය ලෙසත් අනෙක නවීන අනාගමිකත්වය හෙවත් මොඩරේට් සෙකියුලරිසම් ලෙසත් හැඳින්වෙනවා.

> Scholars, such as Jacques Berlinerblau of the Program for Jewish Civilization at the Edmund A. Walsh School of Foreign Service at Georgetown University, have argued that the separation of church and state is but one possible strategy to be deployed by secular governments. What all secular governments, from the democratic to the authoritarian, share is a concern about the relationship between the church and the state. Each secular government may find its own unique policy prescriptions for

> dealing with that concern (separation being one of those possible policies; French models, in which the state carefully monitors and regulates the church, being another).

විකිපීඩියා ව ජැක්විස් බර්ලිනබ්ලවු ගේ පොතක් උපුටා දක්වමින් පවසනවා.

ඒ වගේ ම පොලිටිකල් ක්වාටර්ලි ජර්නලයේ (එය සගරාවක් යැයි කීවේ ජර්නල් යන්නට සිංහල වචනයක් කිව යුතු නිසා - එය හමුවුණේ ගූගල් ස්කොලර් තුළිනුයි) පළ වූ ලිපියක් විසින් බ්‍රිතාන්‍ය අත්දැකීම ගැන පෙන්වා දෙන කරුණුත් සැලකිය යුතු යැයි සිතනවා. මේ Tariq Modood ගේ Moderate Secularism, Religion as Identity and Respect for Religion නම් එම ලිපියේ විවිධ තැන්වලින් ගත් කොටස් කීපයක පරිවර්තන.

> රජීව් භාර්ගව මෙලෙස තර්ක කරයි. අනාගමික රාජ්‍යයක රාජ්‍යය සහ ආගම අතර නිළ හෝ නෛතික ව පිළිගත් බැඳීමක් හෝ සබඳතාවයක් අනුමත නොකෙරේ. තවදුරටත් තර්ක කරන ඔහු; ප්‍රධාන දහරාවේ ලෙස පිළිගත් බටහිර අනාගමිකත්වය තුළ (ආගම සහ රාජ්‍යය) 'වෙන්කර තැබීම ' යන්නෙන් අදහස් වන්නේ අන්‍යෝන්‍ය වශයෙන් සබඳතා අත්හැරීමයි. යනුවෙන් පවසයි.
>
> එක්සත් ජනපදයේ සහ ප්‍රංශයේ පවතින ව්‍යුහයන් යුරෝපයේ උසස් ම නිෂ්පාදනයන් ලෙස නැතිනම් පිළිගත් හෝ ප්‍රධාන ධාරාවේ ලෙස දකින විට ඔහු වැරදි අවබෝධයක සිටින බව මම සිතමි.
>
> ඔහුගේ තර්කය මා හොඳින් ම දන්නා යමක් වන බ්‍රිතාන්‍ය අත්දැකීම පිළිබඳ මෙන් ම පොදුවේ යුරෝපීය අත්දැකීමත් පිළිබඳ පටු අවබෝධයක් මත පදනම් වෙයි. ප්‍රංශ ක්‍රමය සම්මතයට වඩා ව්‍යතිරේඛයක් ලෙස සැලකිය හැකි යුරෝපයේ බොහොමයක් රටවල් (විශේෂයෙන් ම උතුරු සහ බටහිර යුරෝපීය රටවල්) පිළිබඳ වඩාත් නිවැරදි වැටහීමක් ලබා ගත හැක්කේ වඩාත් සංවර්ධිත සහ නවීන අර්ථකථනයන් හරහා මිස බටහිර අනාගමිකත්වය පිළිබඳ භාර්ගවගේ අර්ථකථනය හරහා නොවේ.
>
> පවතින ව්‍යුහයන් වෙනස් කිරීමේ දී බහුසංස්කෘතිකවාදීන් ඓතිහාසික සහ පාරම්පරික අගයන්ට වටිනාකම් ලබාදිය හැකි ක්‍රමවේද ගැන විශේෂ අවධානයක් යොමුකළ යුතු අතර ජනතාවට සාමූහිකත්වය සහ ජාතික අනන්‍යතාවය පිළිබඳ හැඟීමක් ඇතිකිරීමට හැකි අවස්ථාවන් කෙරෙහි සංවේදී විය යුතු ය.
>
> ඉස්මතු වෙමින් පවතින බහු ආගමික තත්ත්වයට මුහුණ දීමේ දී වේවා, වෙනස්කම්වලට ලක් වූ ආගම් හා නිකායන් සුරක්ෂිත කිරීමට සහ ඇතැම් ආගම්වල වරප්‍රසාදිත තත්ත්වයට අභියෝග කිරීමේ දේශපාලනික ප්‍රයත්නයන් හිදී වේවා සමාජ පරිසරය පිළිබඳ සංවේදී වූත් සාම්ප්‍රදායිකවාදී වූත් ප්‍රතිචාරයක්

විසින් සිදුවන්නේ රාජ්‍ය සහ ආගම අතර සබඳතාවය නුසුදුසු ලෙස වැඩිදියුණු කිරීමට වඩා බහුසංස්කෘතිකත්වය කෙරෙහි වඩාත් සුහදායක තත්ත්වයක් කරා ගෙන යෑම යි. ඇත්තෙන් ම වාමාශික දක්ෂිණාංශික දෙපිරිසේම වෙසෙසින් ම රැඩිකල් අනාගමිකවාදීන්ගේ සහ ඉස්ලාම්භීතික ජනප්‍රිවාදීන්ගේ විවේචන නොතකමින් බටහිර යුරෝපයේ බොහොමයක් රටවල සිදුවන්නේ මෙය යි.

බ්‍රිතාන්‍ය අත්දැකීම දෙස බලන විට මේ ආකාරයේ සමානාත්මතාවයක් නැතිනම් බහුසංස්කෘතිකකරණයක් පිණිස ක්‍රමික වැඩිවීමක් ඇති ව ගත් හුදකලා සහ පර්යේෂණාත්මක පියවර රැසක් ම හඳුනා ගත හැකි ය. නිදසුනක් ලෙස වසර කිහිපයකට පෙර නිළබලයෙන් එංගලන්ත (කතෝලික) සභාවේ ප්‍රධානියාද වන කිරුළ ට හිමිකම් කියන චාල්ස් කුමරු අනාගතයේ රාජ්‍යත්වය දැරීමේ දී තමන් රාජ්‍යාගමේ ආරක්ෂකයා යන ඓතිහාසික අභිදානයට වඩා (පොදුවේ) ආගම් ආරක්ෂා කිරීමේ රාජ්‍ය වගකීම දරන්නා යන අභිදානය භාවිත කිරීමට ප්‍රිය කරන බව පවසා සිටියේ ය. ඉතා මෑතක, එනම් 2004 දී, මහරැජින ඇගේ නත්තල් දින සැමරුමේ රූපවාහිනී සහ ගුවන්විදුලි විකාශය බ්‍රිතාන්‍යයේ ආගමික විවිධත්වය පෙන්වා දීමට යොදාගත්තා ය. ග්‍රේස් ඩේවිගේ වදනින් කිවහොත් එතුමියගේ පණිවිඩය වූයේ ආගමික විවිධත්වය යනු සමාජය පොහොසත් කරන්නක් බවත්, එය සම්පතක් ලෙස මිස තර්ජනයක් ලෙස නොදැකිය යුතු බවත් ය. ඇය සීක් දෙව්මැදුරකට සහ ඉස්ලාම් ආගමික සිද්ධස්ථානයකට සුහදතාවය පිණිස ගොඩවදින අයුරුද එම විකාශය තුළ තවදුරටත් ඇතුළත් විය. පසුබිම කියවීමේ දී මෙකී ඇගවුම්කරණයන් අවධානයට ගත යුතු ය. මේවා හුදු සංකේතීය අවස්ථාවන් බව පවසන්නේ නම් බ්‍රිතාන්‍ය රජය බහුආගමික නියෝජිතයන්ගෙන් සැදුම්ලත් උපදේශන මණ්ඩලයන් පත්කිරීමට පරිපාලන කටයුතුවලදී උත්සුක වී ඇති ආකාරය පෙන්වා දිය හැකි ය.

ව්‍යවස්ථාමය අහෝසි කිරීමකින් තොර ව වයවස්ථාපිත රාජ්‍ය-ආගමික සබඳතාවය ලිහිල් ලෙස පවත්වා ගැනීම බහුසංස්කෘතික සමානාත්මතාවයක් කරා ගමන් කිරීමේ පදනම බවට පත්කර ගත හැකි බව ඒ විසින් පෙන්වා දෙයි.

**(The Political Quarterly, Vol. 81, No. 1, January–March 2010
DOI: 10.1111/j.1467-923X.2010.02075.x)**

තවත් වැදගත් කරුණක් Buddhism and the regulation of religion in the new constitution:Past debates, present challenges, and future options මැයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය උදෙසා බෙන්ජමින් ස්කොන්තාල් සහ අසංග වැලිකල ලියූ පත්‍රිකාවක එහි නීතිමය තත්ත්වය විග්‍රහ කරන ආචාර්ය අසන්ග වැලිකල (Lecturer in Public Law, Edinburgh Law School; Director, Edinburgh Centre for Constitutional Law) තව අපූරු කරුණක් පෙන්වා දෙනවා. ඒ මේ වැකියේ ක්‍රියාකාරිත්වය මෙතෙක් කල් පැවතී ඇත්තේ අධිකරණයේ අර්ථ නිරූපණ බලය මත බවයි. එනම් කෙනකුට මෙය යොදාගෙන බුදුදහමට යමක් කරගන්න ඕනෑ හැමවිට ම අධිකරණයට යන්න වෙනවා. ඒ මෙහි භාෂාවේ තිබෙන

උභයාවේගී බව සහ අන්‍යාගම්වල අයිතීන් ද රැකීමට රජය බැඳී සිටීම නිසා මෙහි අරමුණ ගැන ඇතිවන නොපැහැදිලි බව හේතුවෙන්. ඉතින් එවැනි සෑම අවස්ථාවක ම අධිකරණය මෙය අර්ථනිරූපණය කර ඇත්තේ අන් ආගම්වලට අවැඩක් නොවන (බුදුදහමට වැඩක් නොවන) අයුරින්. අධිකරණ ඉතා ම ප්‍රවේසම්කාරීවයි මෙය අර්ථනිරූපණය කර තිබෙන්නේ.

එවැනි නඩු වැලිකල කොටස් දෙකකට බෙදා දක්වනවා. එකක් තමයි භික්ෂු විනයට හානි වන ඇතැම් කටයුතුවලින් භික්ෂූන් වළක්වන ලෙස ඉල්ලමින් (රියදුරු බලපත් ලබා නොදෙන ලෙස සහ නීතිඥයකු ලෙස දිවුරුම් දීමට නොදෙන ලෙස) ඉදිරිපත් වූ ඒවා. අනෙක් කොටස තමයි බුදුදහමට අන්‍යාගම් වලින් එන තර්ජනවලින් ආරක්ෂා කළ යුතු යි යන්න. මුස්ලිම්වරුන් උදෙසා තැනූ සුනාමි ගම්මානයක් සේරුවාවිල පූදබිමට ඉතා ම නුදුරේ වූ නිසා එය භික්ෂූන්ගේ පිණ්ඩපාතය සොයාගැනීම වැනි කටයුතු වලට බධාවක් බව පැවසූ නඩුවක් මීට නිදසුනක්. මේ කොටස් දෙකට ම අයත් නඩු පදනම් වන්නේ බුදුදහම සුරක්ෂිත කළ යුතු ය යන්න මත.කොහොම නමුත් ප්‍රමුඛස්ථානය යන්න නම් හුදෙක් ව්‍යවස්ථාමය සැරසිල්ලක් බව පෙනෙනවා. එය ක්‍රියාත්මක කළ යුත්තේ කෙසේ ද කියා කියන්නේ නැහැ. එවිට මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රස්තානවනාව නමෝ බුද්ධාය කියා ඇරඹීම වැන්නක් පමණයි. මින් මා අදහස් කරන්නේ නැහැ මේ වැකිය සහෝදර ආගමිකයන්ට වඩා සුරක්ෂිත හැඟීමක් ලැබෙන පරිදි ප්‍රතිස්ථාපනය නොකළ යුතු බව. නමුත් එක් දෙයක් කිව යුතු යි. නෝර්වේ, ඩෙන්මාර්කය, ෆින්ලන්තය, එංගලන්තය සහ ස්විස්ටර්ලන්තයේ ඇතැම් කැන්ටනත් කිසියම් ආගමක්/නිකායක් රජය විසින් පිළිත් ඒවා ලෙස විකිපීඩියාව (State Religion) දක්වනවා. (විකිපීඩියාව පිලිගත හැකි මූලාශ්‍රයක් නොවුණත් වෙනත් මූලාශ්‍රයක් හමුවුණේ නැහැ) මේ රටවල් පස්සට ගිය බවක් දකින්න නම් නැහැ.

- සචින්ත මදූෂාන්